# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2010 අංක 2 දරන වාරියපොල රාජමහා විහාර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2010 ජනවාරි මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2010 ජනවාරි මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. **6.00** යි. තැපැල් ගාස්තුව **:** රු. **5.00** යි.

# 2010 අංක 2 දරන වාරියපොල රාජමහා විහාර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2010 ජනවාරි මස 21 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී.) 27/2008.

## වාරියපොල රාජමහා විහාර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීම) සඳහා වූ පනතකි

පූර්විකාව.

"වාරියපොල රාජමහා විහාර සංවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සභාවක්, එහි සාමාජිකයන් විසින් එකඟ වූ රීති අනුව, ඒ හා සම්බන්ධ සියලු පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සභාව පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර ඇති හෙයින් ද, සහ එකී පදනම සංස්ථාගත කරන මෙන් ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම උචිත වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2010 අංක 2 දරන "වාරියපොල රාජමහා විහාර සංවර්ධන පදනම" (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

වාරියපොල රාජමහා විහාර සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

2. (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) වාරියපොල රාජමහා විහාර සංවර්ධන පදනමේ දැනට සාමාජිකයන්ව සිටින සියලුම තැනැත්තන් හා මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් ලෙස ඇතුළත් කරගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) වාරියපොල රාජමහා විහාර සංවර්ධන පදනම යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) මහජනතාවගේ ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසා වාරියපොල රාජමහා විහාරය සෑම අතින්ම සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවන් හි දී විහාරයට අළුතින් කොටස් එකතු කිරීම සඳහා පියවර ගැනීම ;

(ආ) මහජනතාවගේ සදාචාරාත්මක වටිනාකම් වැඩිදියුණු කිරීමට ආධාර කිරීම සහ ඒ සම්බන්ධයෙන් අදාළ පියවර ගැනීම ;

(ඇ) භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපනික සංවර්ධනය උදෙසා පිරිවෙන් හා වෙනත් අදාළ ආගමික ආයතන පිහිටුවීමට, පවත්වාගෙන යෑමට, කළමනාකරණය කිරීමට සහ සංවර්ධනය කිරීමට පියවර ගැනීම ;

(ඈ) පෙර පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ ළමා නිවාස, සම්බන්ධයෙන් ද ඔවුන්ගේ ආගමික අධ්‍යාපනය ද සඳහා වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම ;

(ඉ) දුප්පත්කම සහ ආබාධිත තත්වයන් නිසා තම අධ්‍යාපන කටයුතු දිගටම කරගෙන යෑමට නොහැකි වන ශ්‍රී ලාංකික සිසුන් සඳහා සුහසාධන පහසුකම් සහ ප්‍රතිලාභ, වැඩිදියුණු කිරීමට ආධාර කිරීම ;

(ඊ) බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සහ දස සිල් මාතාවන්ගේ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ අදහසින් අවශ්‍ය පන්ති, දේශන, සම්මන්ත්‍රණ, සම්මේලන, වැඩමුළු, සාකච්ඡා, රැස්වීම්, අධ්‍යාපනික වාරිකා සහ ප්‍රදර්ශන පැවැත්වීම ;

(උ) දිළිඳු, මහලු, අනාථ, හා කායික හා මානසික දුබලතා ඇති අයගේ ප්‍රතිලාභය සඳහා නිවාස සැපයීම සහ ඵලදායි සේවාවල තරුණයන් යෙදවීම සඳහා භාෂා පුහුණු සහ වෘත්තීය පුහුණු පාඨමාලා ආරම්භ කර පවත්වාගෙන යෑම සහ එවැනි පුහුණු පාඨමාලා පවත්වාගෙන යෑමට සහ දිගටම පවත්වාගෙන යෑමට හැකිවන අයුරින් ආදායම් උත්පාදනය කිරීමේ කාර්යය සඳහා පහසුකම් සැළසීම ;

(ඍ) මහජනතාවගේ සුභසාධනය සහතික කිරීමේ අදහස ඇතිව රෝග පාලනය, ව්‍යායාම, ක්‍රීඩා සහ වෛද්‍යාධාර සඳහා සෞඛ්‍ය කඳවුරු සම්බන්ධයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(එ) සාහිත්‍ය, කලාව, කලා ශිල්ප සහ ස්වභාවික සම්පත් ප්‍රවර්ධනය සහ සංරක්ෂණය සම්බන්ධයෙන් ජනතාව තුළ අවබෝධයක් ඇති කිරීම සහ ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායන් ආරක්ෂා කිරීමේ අදහසින් වැඩ පිළිවෙලවල් ආරම්භ කොට පවත්වාගෙන යාම ; සහ

(ඒ) සංස්ථාවේ අරමුණුවලට සමාන අරමුණු ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටවල වෙනත් ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

(2) මේ පනතේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී, ජාතිය, කුලය, ආගම, භාෂාව, ස්ත්‍රී පුරුෂ භේදය හෝ දේශපාලන මතය යන කරුණු සම්බන්ධයෙන් කිසිදු වෙනස්කම් කිරීමකින් තොරව කටයුතු කිරීමට සංස්ථාව විසින් සහතික විය යුතු ය.

**4.** (1) සංස්ථාවේ රීතිවලට අනුකූලව පත්කර ගනු ලබන සංස්ථාවේ සභාපතිවරයා, උපසභාපතිවරයා, ලේකම්වරයා, නියෝජ්‍ය ලේකම්වරයා, සහකාර ලේකම්වරයා, භාණ්ඩාගාරික, ප්‍රධාන සංවිධායක සහ වෙනත් කාරක සභික සාමාජිකයන් හය දෙනෙකුගෙන් සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් විසින් මේ පනතේ විධිවිධානවලට සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මණ්ඩලයට, එය වෙත පවරනු ලැබිය හැකි සියලු හෝ යම් කර්තව්‍යයන් ඉටු කිරීමට බලය ඇත්තේ ය.

(3) මේ පනත ආරම්භ වීමට පෙරාතුව ම වූ දිනයේ දී ධූර දරන්නා වූ පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය යුතු ය.

**5.** මෙම පනත ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දිනට පෙරාතුව දිනයේ දී සභාවේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකුගේ ම සහ ඉන් පසුව සාමාජිකත්වය ලබාගන්නා අයගේ ද නම් ඇතුළත් සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාමට මෙහි අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියා කළ යුතු ය.

සාමාජිකයන් සහ සාමාජික නාම ලේඛනය.

සංස්ථාවේ බලතල.

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව—

(අ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලයට ගැනීම, අත්කර ගැනීමට හෝ කුලියට ගැනීමට හෝ ඉදි කිරීමට හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීමට ;

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව සංස්ථාවේ කාර්යය සඳහා රජයෙන් අනුමත බැංකු හෝ වෙනත් ආයතනවලින් මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට ;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාරගැනීමට, වට්ටම් දීමට, සහතික කිරීමට, ගනුදෙනු කිරීමට, මිලයට ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ වැසීමට ;

(ඈ) සංස්ථාවේ කාර්යය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදලක් මණ්ඩලය සුදුසු යයි සලකන ආකාරයකින් ආයෝජනය කිරීමට ;

(ඉ) දායක මුදල්, සම්මාදම්, ප්‍රදානයන්, පරිත්‍යාග හා සියලුම වර්ගවල ත්‍යාග ඉල්ලා සිටීමට හා භාර ගැනීමට ;

(ඊ) යම් තැනැත්තකු, සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක්, සමග ගිවිසුම්වලට හා කොන්ත්‍රාත්වලට එළඹීමට ;

(උ) යම් ස්ථාවර දේපළකට හෝ පෞද්ගලික දේපළකට සම්බන්ධ යම් නීත්‍යානුකූල භාර සහ ගිවිසුම් ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හා පරිපාලනය කිරීමට ;

(ඌ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කරවීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා, හා පාරිතෝෂික ගෙවීමට ;

(එ) සංස්ථාවේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි සේවක පිරිස් පුහුණු කිරීමට ; සහ

(ඒ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය වෙනත් සියලු දේ කිරීමට,

මෙම පනතින් සංස්ථාවට බලය පවරා ඇත්තේ ය.

**7.** (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම හා වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, නිල දරන්නන් ධුර අත්හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ විධායක මණ්ඩලයේ බලතල, කාර්යය හා චර්යාව ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, සේවකයන්, අනුයෝජිතයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය හා කර්තව්‍ය ;

(ඈ) සංස්ථාවේ, රැස්වීම් කැඳවීම හා පැවැත්වීම, එකී රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්යය පටිපාටිය, එකී රැස්වීම් පැවැත්වෙන ස්ථානය හා වේලාව පිළිබඳ දැන්වීම් සහ න්‍යායපත්‍ර සකස් කිරීම, ගණපූරණය තීරණය කිරීම හා එහි කටයුතු පවත්වාගෙන යාම ;

(ඉ) මණ්ඩලයේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් නිශ්චය කිරීම ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාවේ රීති මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

8. (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාව වෙනුවෙන් භාර ගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන, මණ්ඩලය විසින් අනුමත කරනු ලබන බැංකුවක සංස්ථාවේ බැරට තැබීමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

ගිණුම් හා විගණනය.

9. (1) සංස්ථාවේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනවලින් යම් ආයතනයක සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**10.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය හා පදනම වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**12.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙහි ලා හැකියාව හා බලය ඇත්තේ ය. තව ද, එකී සියලු දේපළ මේ පනතේ කාර්යය සඳහා සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව, ඒවා විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව සංස්ථාව විසින් දරනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**13.** සංස්ථාවේ මුද්‍රාව, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන තැනැත්තකුගේ භාරයේ තැබිය යුතු අතර, සභාපති සහ තවත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ඉදිරිපිට දී මිස, එකී මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. තව ද, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**14.** ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.